**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

---------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් **3643** ක් සිදු කර තිබූ අතර එම ලියාපදිංචි කිරීම්, අයදුම්පත් ලද වර්ෂය අනුව වර්ගීකරණය කර නොතිබීම නිසා වර්ෂය තුළ ලැබෙන අයදුම්පත් එම වර්ෂය තුළදීම ලියාපදිංචියක් සිදු නොවන බව කාර්යසාධන වාර්තාවෙන් නිරූපනය වී නොතිබුණි. | වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කාර්ය සාධනය ඉදිරිපත් කිරීමේ දී එක් එක් වර්ෂ වල දී ඉටුකළ කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් තොරතුරු ඉදිරිපත් කළ අතර, එම ඉටු කළ කාර්යයන් අයදුම්පත් ලද වර්ෂය අනුව වර්ගීකරණය කිරීම අත්‍යාවශ්‍ය නොවන බැවින් එලෙස වර්ගීකරණයක් නොකළ බව. ඊලග වසරේ සිට එම තොරතුරු ද ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | එක් එක් වර්ෂයේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම්වල ප්‍රගතිය දැක්වීමේදී එම ලියාපදිංචිකිරීම්, අයදුම්පත් ලද වර්ෂය අනුව වර්ගීකරණය කර දැක්වීම කළ යුතුය. |

### 2.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 31 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබූ අතර සේවාවාර වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 7.5 ක් ද ඇතුළත් ගිවිසුම්ගත මුදල වූ රු.මිලියන 32.5 ක් එදිනම ගෙවා තිබුණි. එහෙත් මෙම ගිවිසුම ICTA ආයතනය කඩකර තිබූ අතර 2020 පෙබරවාරි 20 දිනැති අංක CP/20/0139/215/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැවත ගිවිසුමකට එළඹීමට ක්‍රියාමාර්ග ගෙන ඇතත් එසේ ගිවිසුම්ගත වී නොතිබුණි. අනතුරුව 2022 දෙසැම්බර් මාසයේදී පැවති සාකච්ඡා අනුව Cloud Server (LGS) පද්ධතිය මෘදුකාංග සහිතව ලබාදීමට එකඟ වී ඇතත්, එය පවත්නා පද්ධතියට නොගැලපෙන බැවින් වෙනත් සුදුසු විකල්පයක් වෙත එළඹීම සුදුසු බව 2023 මාර්තු 27 දින පැවති සාකච්ඡාවේදී ICTA ආයතනය විසින් දන්වා තිබුණි. | Telecom Cloud Server පද්ධතියකට හෝ වෙනත් සුදුසු විකල්පයක් වෙත ප්‍රවිශ්ට වන ලෙසත් අවශ්‍ය තාක්ෂණික සහාය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) ලබා දිය හැකි බවත් ICTA විසින් දන්වා ඇති අතර, එම ආයතනය වෙත ගෙවූ රු.මිලියන 32.5ක මුදල ආපසු ගෙවීමට අවශ්‍ය පියවර ගැනීමට, බුද්ධිමය දේපළ කාර්යාලය වෙත අවශ්‍ය ලේඛනවල පිටපත් යොමු කළ බව. | කාල පමාවකින් තොරව ගෙවන ලද රු. මිලියන 32.5ක මුදල ද හිලව් වන පරිදි server අවශ්‍යතාව සපුරාගත යුතුය. |

## 3. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හඳුනාගත් අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්ත්වය පාදක දත්ත ලෙස හඳුනාගැනීමත් ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක පැහැදිළිව හඳුනාගැනීමත් කළ යුතු වුවත් එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේ ලබාගත් ප්‍රගතිය සියයට 0, සියයට 65 හා සියයට 75 ලෙස ප්‍රතිශත මට්ටම් වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ දක්වා ඇතත් එම ප්‍රගති අගයන්හි නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්කර තිබූ ප්‍රගතිය මෙහි දක්වා ඇති අතර, සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව මඟින් එහි නිවැරදිතාවය තහවුරු කරගත හැකි බවත් පාදක වර්ෂයට සාපේක්ෂව ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ඉදිරි වර්ෂවල දී පියවර ගන්නා බව. | හඳුනාගත් අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්ත්වය පාදක දත්ත ලෙස හඳුනාගැනීමත් ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක පැහැදිළිව හඳුනාගැනීමත් කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත අභ්‍යන්තර විගණක තනතුර වසර 4 ක කාලයක සිට පුරප්පාඩුව පැවති අතර, 2022 ඔක්තෝබර් 17 සිට රාජකාරි ආවරණය පදනමින් නිලධාරියෙකුව පත් කර තිබුණි. | අභ්‍යන්තර විගණක පුරප්පාඩුවට නිලධාරියකු අනුයුක්ත කර ගැනීමට වරින් වර අමාත්‍යාංශයට කළ ඉල්ලීම් අනුව 2022 ඔක්තෝබර් මස සිට රාජකාරි ආවරණය සඳහා නිලධාරිනියකු පත්කර තිබුණි. එහෙත් එම නිලධාරිනියගේ ඉල්ලීම මත 2023 මාර්තු සිට එම රාජකාරියෙන් නිදහස් කර නැවත 2023 මැයි සිට රාජකාරි ආවරණය සඳහා නිලධාරිනියකු පත් කළ බව. | අභ්‍යන්තර විගණනය, ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම, එහි කාර්යසාධනය ඉහල නංවා ගැනීම සඳහා සහාය වන්නා වූ ක්‍රියාවලියක් බැවින් එය සක්‍රිය කර ගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත පේටන්ට් පරීක්ෂක තනතුරු 10 න් 9ක්ම වර්ෂ 6කට වැඩි කලක සිට පුරප්පාඩු වී පැවති අතර මෙය දෙපාර්තමේන්තුගත තනතුරක් වුවද, එම තනතුරු සඳහා සංවර්ධන නිලධාරීන්ව අනුයුක්ත කර ඇතත් විවිධ හේතු මත එය ඵලදායී වී නොතිබුණි. | ආශ්‍රිත සේවයේ නව බඳවා ගැනීම් නවතා ඒ වෙනුවට 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වරින් වර විද්‍යා උපාධිධාරී සංවර්ධන නිලධාරීන්ව යොමු කළ බව. එම නිලධාරීන්ට පේටන්ට් පරීක්ෂාව පිළිබඳ පුහුණුව දුන්නද වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය යටතේ ස්ථාන මාරුවීම් ලැබෙන බැවින් කාර්යක්ෂම සේවයක් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි බව. එබැවින් එම සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් මෙම තනතුරට බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කර විභාග නිවේදනය විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | **සංවර්ධන නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදෙන බැවින් ලබාදෙන පුහුණුව ඵලදායි කරගැනීමට යෝජිත බඳවා ගැනීම් ප්‍රමාද නොකළ යුතුය.** |
| (ආ) | බුද්ධිමය දේපල නිළධාරී තනතුරු 21 ක් අනුමත කර පැවතියද, පසුකාලීනව තනතුර දරන්නාට පෞද්ගලිකවන සේ තනතුරු 10 ක් අනුමත කර තිබුණි. මේ වන විට ඉන් තනතුරු 05 ක් අහෝසි වී තිබුණි.එම තත්ත්වය වෙළඳ ලකුණු අංශයේ කාර්යසාධනය අඩුවීමට හේතු වී තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරු 21 ක් තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේදී එම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු 10 ක් අනුමත කර ඇත. නිලධාරින් විශ්‍රාම යාම, සේවයෙන් ඉල්ලා අස්වීම යන හේතු මත මේ වන විට නිලධාරීන් 05 දෙනෙකු පමණක් සේවයේ නිරතව සිටිති. මෙම කාර්යාලයේ නිලධාරි හිඟය එදායිතාවයට හේතුවන බැවින් එම තනතුර "දරන්නාට පෞද්ගලික වන සේ "යන්න ඉවත් කර, පෙර අනුමත කර තිබූ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරු නැවත අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර දෙන ලෙස 2023 මාර්තු මස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | වෙළඳ ලකුණු අංශයේ කාර්යසාධනය ඉහල නැංවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |